D170

# මනෝවිද්‍යාත්මක උපදේශනය සඳහා බෞද්ධ න්‍යායාත්මක ප්‍රවේශයක්

**Buddhist Theoretical Approach for Psychological Counselling**

**ඒ.එම්. සුරංග ගුණසිරි අමරකෝන්**

**A.M. Suranga Gunasiri Amarakoon**

**ලි.ප.අංකය / Reg.No.: 2015/Ph.D/91**

T

**කොළඹ විශ්වවිද්‍යාලයේ - බෞද්ධ අධ්‍යයන අංශයේ**

**දර්ශන විශාරද උපාධිය**

**සඳහා ඉදිරිපත් කරනු ලබන ස්වාධීන නිබන්ධය**

University of Colombo
Library
Sri Lanka

Thesis for Doctor of Philosophy

Department of Buddhist Studies - University of Colombo

UCLIB
590597

**2018**

## සංක්ෂේපය (Abstract)

උපදේශනය යනුවෙන් වර්තමානයේ සැලකෙන ආකාරයේ ක්‍රමවේදයක් බෞද්ධ සම්ප්‍රදාය තුළ දක්නට නොලැබුන ද පුද්ගල හා සමාජ යහපැවැත්ම අරමුණු කර ගත් ගැඹුරු දාර්ශනික ඉගැන්වීම් වලින් බුදුදහම පොහොසත්ය. බුද්ධ දේශනාවේ ප්‍රමුඛතම අභිප්‍රාය වන්නේ මානව වර්ගයා හමුවේ ඇති දුක නැමැති මූලික ගැටලුවෙන් මිදීම සඳහා වූ ආචාරවිද්‍යාත්මකවූත්, මනෝවිද්‍යාත්මකවූත්, ඥානමීමංසාත්මකවූත් ත්‍රිවිධ ශික්‍ෂා සංඛ්‍යාත පිළිවෙත් මාර්ගය පෙන්වාදීම බවත් එම සංකල්පය පදනමේ කරගෙන බෞද්ධ උපදේශන සිද්ධාන්තයක් ගොඩනැගිය හැකි බව මෙම පර්යේෂණයේ මූලික අභ්‍යුපගමය යි.

බෞද්ධ මනෝවිද්‍යාත්මක උපදේශන සිද්ධාන්තයක් සකස්කර ගැනීමෙහිලා උපයෝගීවන මූලික දාර්ශනික සංකල්පය ලෙස මෙම අධ්‍යයනයේ දී හඳුන්වා දෙනු ලබන්නේ **ත්‍රිලක්ෂණය** යි. ඒ අනුව බෞද්ධ උපදේශනය, ත්‍රිලක්‍ෂණ න්‍යාය මත පදනම් වූ අන්තර්ඥාණයට හෙවත් ප්‍රතිවේදයට නැඹුරුවූවකි. එම ත්‍රිලක්‍ෂණ සිද්ධාන්තය පදනම් කරගනිමින් උපදේශන සේවාලාභියාගේ ස්වභාවය, බෞද්ධ උපදේශකවරයාගේ ස්වභාවය, බෞද්ධ උපදේශනයෙන් අපේක්ෂිත මානසික සෞඛ්‍යය හා යහපැවැත්ම පිළිබඳව හා ඒ සඳහා අනුගමනය කළ යුතු උපදේශන ක්‍රියාවලියේ මූලිකාංග පිළිබඳව මෙහිදී විග්‍රහ කෙරේ. බෞද්ධ උපදේශනයේ මූලික අභිමතාර්ථ 02 කි. එනම් දෛනික ජීවිතයේ පවතින විශේෂිත හා ගැටලුකාරි තත්වයෙන් මිදීමට අවශ්‍ය සුව පෞරුෂත්වයෙහි මූලිකාංග සංවර්ධනය හා පුද්ගලයා හා සමාජය තුළ පවත්නා සදාතනික ගැටලුවලට විසඳුම් සෙවීමෙහිලා උපයෝගිවන විශිෂ්ටත්වය කරා මෙහෙයවීමයි.

උපදේශන සේවාලාභියාගේ ස්වභාවය, පෞරුෂත්වය හා පෞරුෂත්ව වර්ගීකරණය යනුවෙන් බෙදා දක්වේ. පෞරුෂත්ව සංකල්පය මඟින් පුද්ගලයා තුළ දක්නට ලැබෙන පොදු ලක්‍ෂණ හා විශේෂ ගති ලක්‍ෂණ පිළිබඳව විස්තර කෙරේ. මෙසේ දක්වෙන පුද්ගලයාගේ සියලුම පෞරුෂත්ව ලක්‍ෂණ ත්‍රිලක්‍ෂණ සිද්ධාන්තයට අනුකුල බව පෙන්වා දෙනු ලැබේ. ඒ පඤ්චස්කන්ධ විභාගය හා පටිච්චසමුප්පාද ඉගැන්වීම් ඇසුරෙනි. ඒ අනුව පුද්ගල පෞරුෂයේ දක්නට ලැබෙන විශේෂතා පවා අනිවාර්ය ලක්‍ෂණයක් නොව නිරන්තර වෙනසකට භාජනය වෙමින් පවතී. මෙහිදී පුද්ගල වර්ගීකරණය සිදුකර ඇත්තේ පෞරුෂත්ව සංවර්ධනය අරමුණු කර ගනිමිනි. පුද්ගලයාගේ ප්‍රඥාව,

චිත්තවේග හා චර්යාව යන සාධක ඇසුරෙන් කර ඇති එම වර්ගීකරණය විද්‍යාත්මක පදනමකින් යුත්තය.

බෞද්ධ උපදේශකවරයාගේ ස්වභාවය පිළිබඳ සාකච්ඡාවේ දී උපදේශකවරයාගේ භූමිකාව, උපදේශකවරයා තුළ තිබිය යුතු පෞරුෂය, පුද්ගලයා හා ලෝකය පිළිබඳ දෘෂ්ටිකෝණය, හර පද්ධතිය හා උපදේශන කුසලතා පිළිබඳව විමසා බැලේ. උපදේශකවරයාගේ භූමිකාව තීරණය කෙරෙන්නේ උපදේශනය පිළිබඳ බෞද්ධ දෘෂ්ටිකෝණයට අනුවය. ඒ අනුව අනුසාසනී ප්‍රාතිහාර්යය යන සංකල්පය ඇසුරෙන් විග්‍රහ කෙරෙන බෞද්ධ උපදේශනය මඟින් පුද්ගල හා සමාජ ගැටලු නිරාකරණයට යථාර්ථවාදී මඟ පෙන්වීමක් කරයි. බෞද්ධ උපදේශන කුසලතා ප්‍රධාන වශයෙන් චින්තන, චිත්තවේගීය හා සමාජ කුසලතා යන අංශ තුනකින් සමන්විතය.

බෞද්ධ උපදේශනයෙන් අපේක්ෂිත මානසික සෞඛ්‍යය හා යහපැවැත්ම පිළිබඳ අර්ථකථනය චතුරාර්ය සත්‍යය න්‍යාය ඇසුරෙන් පැහැදිලි කෙරේ. ඒ අනුව මානසික සෞඛ්‍යය ගැටලුවල ස්වභාවය, ගැටලුවල ප්‍රභවය හා මානසික සෞඛ්‍යය හා යහපැවැත්ම යන කරුණු මෙහිදී සාකච්ඡා කෙරේ. මානසික සෞඛ්‍යය ගැටලු ප්‍රධාන කරුණු 03කට වර්ග කෙරේ. ඒ, චින්තනය, චිත්තවේග හා චර්යාව සම්බන්ධ ගැටලු වශයෙනි. එම ගැටලු ඇතිවීම සඳහා බලපාන හේතු චිත්ත - චෛතසික හා ප්‍රපංචකරණය යන සංකල්ප ඇසුරෙන් විස්තර කෙරේ. පුද්ගලයාගේ මානසික සුවය හා යහපැවැත්ම ඥාණමය, භාවමය හා චර්යාමය යහපැවැත්ම යන මූලික සංඝටක තුනකින් සමන්විතය.

බෞද්ධ උපදේශන ක්‍රියාවලියේ දී සේවාලාභියාගේ ඥාණමය, චිත්තවේගිමය හා චර්යාමය යහපැවැත්ම කෙරෙහි සුවිශේෂ අවධානයක් යොමු කෙරේ. ඒ අනුව සේවාලාභියෙකුට තම ගැටලුවෙන් මිදීම සඳහා නිර්දේශ කරනු ලබන්නේ ඥාණමය පරිවර්තනය, චිත්තවේගීය ශික්ෂණය හා චර්යාමය හැඩගැස්ම යන ත්‍රි ශික්ෂාව යි. ඒ අනුව ඥාණමය පරිවර්තනය ඇති කර ගැනීම සඳහා ඥාණය - ප්‍රඥාව හා වීමංසී යන සංකල්ප ද චිත්තවේගීය ශික්ෂණය සඳහා සද්ධා - විරිය, සති - සමාධි හා අරිය ධෝවන - අරිය විරේචන යන සංකල්ප ද චර්යාමය අභිසංස්කරණය සඳහා සීල - සංවර හා පටිසේවනා - පරිවජ්ජනා යන සංකල්ප ද යොදා ගැනේ. බෞද්ධ මනෝ උපදේශනයෙහි ඇති සුවිශේෂත්වයක් වන්නේ එදිනෙදා ජීවිතයේ මුහුණ දෙන ගැටලුකාරී තත්වයන් සමනය කර ගැනීමට සීමානොවී සේවාලාභියාට බුදුදහමේ ඉගැන්වෙන ශ්‍රේෂ්ඨත්වයට මඟ පෙන්වීමයි. මෙහිදී උපදේශකවරයා පළමුව තමා විසින් ලැබූ පරිචයකින් යුක්තවීම බෞද්ධ උපදේශනයේ පිළිවෙතයි.